# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1595 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 17/10 /2024 පැය 0645

## මාධ්‍ය නිවේදනය

**01. අල්ලස් ලබා දීමට තැත් කළ පුද්ගලයෙකු අත්අඩංගුවට - මට්ටක්කුලිය පොලිස් ස්ථානය.**

2024.10.16 වන දින මට්ටක්කුලිය පොලිස් ස්ථානයේ වැඩබලන ස්ථානාධිපතිට පුද්ගලයෙකු විසින් දුරකථන ඇමතුමක් ලබාදී පොලිස් බල ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය ජාවාරම් සිදුකිරීමට අවස්ථාව දෙන ලෙසත්, ඒ සඳහා මසකට රුපියල් 100000/= ක අල්ලස් මුදලක් ලබා දීමට කැමති බවත් සඳහන් කර ඇත.

මේ සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව දැනුවත් කල වැඩබලන ස්ථානාධිපතිවරයා සැකකරු පොලිස් ස්ථානයට කැඳවා මුදල් රුපියල් 50000/=ක් ලබා දීමට උත්සාහ කිරීමේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නිලධාරීන් සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**02. මරණ දඬුවම් ලබා දීමක් - ගාල්ල පොලිස් ස්ථානය.**

2000.02.06 වන දින ඉමදූව පොලිස් වසමේ කොරටුහේනගොඩ ප්‍රදේශයේදී අනවසර විදුලි රැහැන් ඇද චේතනාන්විතව පුද්ගලයෙකු විදුලි සැර වැදීමට සලස්වා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීම සම්බන්ධයෙන් ගාල්ල ගරු මහාධිකරණයේ විභාග වූ දීර්ඝ නඩු විභාගයකින් අනතුරුව නඩුවේ තීන්දුව ප්‍රකාශයට පත් කරමින් එහි වූදිතට 2024.10.16 වන දින මරණ දඬුවම ලබා දී ඇත.

**වූදිත වයස අවුරුදු 50 ක් වන ඉමදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**